*සැ. යු.*– 2007.06.15 වැනි දින අංක 1,502 දරන *ගැසට් පත්‍රයෙහි* I : III කොටස පළ නොකරන ලදී.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* **V** කොටසේ 2002 වර්ෂයේ මුද්‍රිත පොත් නාමාවලියේ ඔක් - සැප්තැම්බර් කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,503 - 2007 ජූනි 22 වැනි සිකුරාදා - 2007.06.22**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 606 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 604 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 607 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජූනි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජූනි මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - මල්ලාකම්

මල්ලාකම් මහෙස්ත්‍රාත් අධිකරණයේ අයිතිකරු නොමැති රන්භාණ්ඩ වෙන්දේසි කිරීම (ඒ. 121/02)

අයිතිකරු නොමැති පහත සඳහන් රන් භාණ්ඩ 2007.07.21 වැනි දින පැය 10.00 ට මල්ලාකම් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. අධිකරණයේ විනිසුරුගේ අධීක්ෂණය යටතේ වෙන්දේසි කරනු ලැබේ. වෙන්දේසි කරනු ලබන සියලුම රන් භාණ්ඩවල අවසන් තීරණය නීතිපති තුමාගේ කාර්ය පටිපාටියට අනුකූලව සිදු කරනු ලැබේ.

02. රන් භාණ්ඩ පරීක්ෂාකර බැලීමටත් බර කිරා මැන බැලීම සඳහාත් අවශ්‍ය කටයුතු දැනට සූදානම් කර ඇත.

03. රන් භාණ්ඩ විකිණීමට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත රන් භාණ්ඩ ගැණුම් කරුවන්ට පරීක්ෂා කර බැලීම සඳහා අවස්ථාව සලසා ඇත.

04. වෙන්දේසි කරනු ලබන රන් භාණ්ඩ අධිකරණමය කාර්යපටිපාටියට අනුකූලව සිදු කරන බැවින් වෙන්දේසියේ දී ගැණුම්කරුවන් විසින් මිලදී ගන්නා ලද රන් භාණ්ඩවල බර හා තත්ත්වය සම්බන්ධයෙන් වගකීම එම ගැණුම්කරුවන් විසින් දැරිය යුතුය.

05. වෙන්දේසියේ දී වෙන්දේසි කරනු ලබන රන්භාණ්ඩ අවසන් මිල නියම කරන ලද පුද්ගලයා විසින් එහි මුලු මුදල එම අවස්ථාවේ දීම ගෙවා එම රන් භාණ්ඩ ලබා ගත යුතුය.

06. රන් භාණ්ඩ ගැණුම් කරුවන් තමාගේ සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, ජා. හැ. අංකය ගැණුම්කරුවන් විසින් අධිකරණයට ඉදිරිපත් කළ යුතු අතර බිල්පතක් නිකුත් කරනු ලැබේ.

07. වෙන්දේසි කරන ලද රන් භාණ්ඩ නැවත අධිකරණය විසින් භාරගනු නොලැබේ.

08. වෙන්දේසි කිරීමට නියම කර ඇති රන් භාණ්ඩ වෙන්දේසි කිරීමට පෙර හෝ වෙන්දේසි කරන අවස්ථාවේ දී හේතුවක් නොමැතිව වෙන්දේසි කිරීම අත්හිටුවීමට අධිකරණයට බලය ඇත.

09. වෙන්දේසි කරනු ලබන රන් භාණ්ඩවල වටිනාකම කාර්යමණ්ඩලය නියම කර ඇති වටිනාකමට අඩුවෙන් වෙන්දේසි කිරීමක් සිදු නොවනු ඇත. තවද, වෙන්දේසි කරනු ලබන රන් භාණ්ඩවල මුල් වටිනාකම කාර්ය මණ්ඩලය විසින් තීරණය කර දැනුම් දෙමි.

එස්. ඉලංගෝවන් මහත්මිය,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මල්ලාකම්.

මල්ලාකම් මහෙස්ත්‍රාත් අධිකරණයේ වෙන්දේසි කරනු ලබන භාණ්ඩ පිළිබඳ විස්තරය

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය අංකය | වර්ගය | බර ප්‍රමාණය | තීන්දු දිනය |
|---|---|---|---|---|---|
| 01. | ඒ. ආර්. 121/02 | දම්වැල් එකයි | රත්තරන් | 19.70 ග්‍රෑ. | 01.04.2002 |
| 02. | ඒ. ආර්. 121/02 | නෙක්ලස් එකයි | රත්තරන් | 24.62 ග්‍රෑ | 01.04.2002 |
| 03. | ඒ. ආර්. 121/02 | නෙක්ලස් එකයි | රත්තරන් | 18.32 ග්‍රෑ. | 01.04.2002 |
| 04. | ඒ. ආර්. 121/02 | දම්වැල් එකයි | රත්තරන් | 7.70 ග්‍රෑ. | 01.04.2002 |
| 05. | ඒ. ආර්. 121/02 | මුදු එකයි | රත්තරන් | 18.70 ග්‍රෑ, | 01.04.2002 |
| 06. | ඒ. ආර්. 121/02 | මුදු එකයි | රත්තරන් | 3.45 ග්‍රෑ. | 01.04.2002 |
| 07. | ඒ. ආර්. 121/02 | මුදු එකයි | රත්තරන් | 4.80 ග්‍රෑ. | 01.04.2002 |
| 08 | ඒ. ආර්. 121/01 | පොඩි මුදු එකයි | රත්තරන් | 1.00 ග්‍රෑ. | 01.04.2002 |
| 09. | ඒ. ආර්. 121/02 | පොඩි මුදු එකයි | රත්තරන් | 0.75 ග්‍රෑ. | 01.04.2002 |
| 10. | ඒ. ආර්. 121/02 | රතු ගලක් සහිත මුදු එකයි | රත්තරන් | 1.00 ග්‍රෑ. | 01.04.2002 |
| 11. | ඒ. ආර්. 121/02 | මුදු එකයි | රත්තරන් | 3.30 ග්‍රෑ. | 01.04.2002 |
| 12. | ඒ. ආර්. 121/02 | මුදු එකයි | රත්තරන් | 1.20 ග්‍රෑ. | 01.04.2002 |
| 13 | ඒ. ආර්. 121/02 | කරාබු ජෝඩු එකයි | රත්තරන් | 9.90 ග්‍රෑ. | 01.04.2002 |
| 14. | ඒ. ආර්. 121/02 | කරාබු ජෝඩු එකයි | රත්තරන් | 5.70 ග්‍රෑ. | 01.04.2002 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය | වර්ගය | බර ප්‍රමාණය | තීන්දු දිනය |
|---|---|---|---|---|---|
| 15. | ඒ. ආර්. 121/02 | කරාබු ජෝඩු එකයි | රත්තරන් | 9.40 ග්‍රෑ. | 01.04.2002 |
| 16. | ඒ. ආර්. 121/02 | කරාබු ජෝඩු එකයි | රත්තරන් | 3.30 ග්‍රෑ. | 01.04.2002 |
| 17. | ඒ. ආර්. 121/02 | පෙන්ඩන් එකයි | රත්තරන් | 7.50 ග්‍රෑ. | 01.04.2002 |
| 18. | ඒ. ආර්. 121/02 | පෙන්ඩන් එකයි | රත්තරන් | 1.30 ග්‍රෑ. | 01.04.2002 |
| 19. | ඒ. ආර්. 121/02 | මුදු එකයි | රත්තරන් | 1.80 ග්‍රෑ. | 01.04.2002 |
| 20. | ඒ. ආර්. 121/02 | ගල් ඇල්លූ පෙන්ඩන් | රත්තරන් | 3.80 ග්‍රෑ. | 01.04.2002 |
| 21. | ඒ. ආර්. 121/02 | වළලු ජෝඩු එකයි | රත්තරන් | 15.80 ග්‍රෑ. | 01.04.2002 |
| 22. | ඒ. ආර්. 121/02 | වලලු එකයි | රත්තරන් | 2.50 ග්‍රෑ. | 01.04.2002 |
| 23. | ඒ. ආර්. 121/02 | වලලු ජෝඩු එකයි | ඉමිටේෂන් | - | 01.04.2002 |

06-413

---

## මහේස්ත්‍රාත් අධිකරණය – බණ්ඩාරවෙල

### අධිකරණය වෙත ඉදිරිපත් කර රාජසන්තක කරන ලද භාණ්ඩ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද භාණ්ඩ 2007.07.07 වෙනි දින පෙ.ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ණ අවසරය මත වෙන්දේසිය ආරම්භ වීමට පැය 1/2 කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැණුන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

05 වෙන්දේසියේදී මිල දී ගනු ලබන භාණ්ඩ එවලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියළුම ගෙවීම් මුදලින් කල යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නා සෑම අයෙකුම තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

අජිත් එම් මාසිංහ,<br>
මහේස්ත්‍රාත්, අතිරේක දිසා විනිසුරු,<br>
මහේස්ත්‍රාත් අධිකරණය,<br>
බණ්ඩාරවෙල.

2007 ජූනි මස 04 වෙනි දින,<br>
බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | බී. ආර්. 11/2005 | අංක 970504103 දරන මවුන්ටන් වර්ගයේ පාපැදි 01යි |
| 02. | එම | අංක 94622971 දරන පාපැදි 01 යි |
| 03. | එම | අංක 950307014 දරන පාපැදිය 01 යි |
| 04. | එම | අංක 20407962 දරන පාපැදි 01යි |
| 05. | එම | අංක 50260171 දරන පා පැදිය 01 යි |
| 06. | එම | අංකය අපැහැදිළි බයිසිකල් 01 යි |
| 07. | එම | අංක 01202764 දරන පා පැදි 01 යි |
| 08. | එම | කහපාටැති සහ කළු පාට පැදි 01 යි |
| 09. | එම | අංක ආර්. ආර්. 5363 දරන පාපැදි 01යි |
| 10. | එම | අංක 2158956 දරන රතුපාට පාපැදිය 01යි |
| 11. | එම | අංක 49149 දරන කළුපාට පා පැදිය 01යි |
| 12. | එම | අංක ජේ. ජේ. 003622 දරන මවුන්ටන් බයිසිකල් 01 යි |
| 13. | එම | අංක එල්. එස්. 20404244 දරන මවුන්ටන් බයිසිකල් 01 යි |
| 14. | එම | "එවරස්ට්" කුඩා පා පැදි 01යි |
| 15. | එම | එස්. එස්. 030191 දරන කළුපාට පා පැදි 01යි |
| 16. | එම | වර්ගය නොදන්නා 2064 දරන කළුපාට පා පැදි 01 යි |
| 17. | එම | 4 බී 07208 දරන හීරෝ වර්ගයේ පාපැදිය |
| 18. | එම | "මවුන්ටන්" වර්ගයේ කොළපාට පාපැදිය |
| 19. | එම | කොළපාට කවරය සහිත "රෂියා" වර්ගයේ දුරදක්න 01 යි |
| 20. | එම | "ඇමරෝන් " වර්ගයේ වාහන බැටරි 01 යි, |
| 21. | එම | අංක 408396 දරන "සොලැක්ස්" වතුර මෝටර් 01 යි |
| 22. | එම | රතුපාට ප්ලාස්ටික් පුටු 04 යි |
| 23. | එම | 13.05 ප්‍රමාණයේ නිල්පාට ගෑස් සිලින්ඩර් 01යි |
| 24. | එම | "කොස්මෝ" වර්ගයේ අඟල් 14 කළු සුදු රූපවාහිනී 01යි. |
| 25. | එම | අංක 50183737 දරන "හිතාචි" වර්ගයේ ඩෙක් යන්ත්‍රය හා එහි දුරස්ථ පාලකය. |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 26. | එම | අංක 0911/12100 දරන ඇළුමිනියම් ජැක් 01යි |
| 27. | එම | අංක 811 කේ. ටී. 0006 දරන අහල් 14එල්. ජී. වර්ගයේ වර්ණ රූපවාහිනී 01යි (එහි දුරස්ථ පාලකය සමග) |
| 28. | එම | සුදුසුපාට ලොකු බැටරි 01යි |
| 29. | එම | අංක 00948 "පැනසොනික්" වර්ගයේ ඩෙක් යන්ත්‍ර 10යි. |
| 30. | එම | කොන් වර්ගයේ යකඩ විදින මැෂින් එකක් අඩංගු රෝස පාට ප්ලාස්ටික් පෙට්ටි 01යි. |
| 31. | එම | බැටරි චාජර් 01යි |
| 32. | 70312 | පී. සී. යුනිට් 01 යි |
| 33. | එම | මොනිටර් 02යි. (4008056 සහ 60046989) |
| 34. | එම | කී බෝඩ් 01යි |
| 35. | එම | මවුස් 01 යි |
| 36. | එම | ටෙලිෆෝන යුනිට් 13 යි |
| 37. | එම | ටෙලිෆොන් පියුස් යුනිට් 01යි. |
| 38. | එම | මල්ටි ප්ලග් 01යි |
| 39. | එම | පවර් පැක් 01යි |
| 40. | එම | ඩේටා කේබල් සහ පවර් කෝර්ඩ් |
| 41. | එම | යූ. පී. එස්. 01 යි (ඩබ්. එස්. 0148140063) |
| 42. | 47894 | ඇළුමිනියම් මුට්ටි 2යි |
| 43. | 68992 | ලොකු කියත් 01යි |
| 44. | 53698 | රතුපාට ප්ලාස්ටික් බේසම් 01යි |
| 45. | (විවිධ) | විවිධ නඩු අංකවලට අදාළ කැබලිවලට වෙන් කරන ලද ජංගම ඉරුම් කට්ටලවල සුන්බුන් |
| 46. | 56948 | ඇළුමිනියම් මුට්ටි 01 යි |
| 47. | එම | සෙම්බු 01 යි |
| 48. | 53610 | ඇළුමිනියම් පෝච්චි 01 යි |
| 49. | 46994 | ලොකු සහ පොඩි අළුමිනියම් මුට්ටි 02 යි |
| 50. | 77074 | අංක එල්. ජී. 97/1864317 දරන සෙල් ගෑස් සිලින්ඩර් 01 යි |
| 51. | 58809 | ආරක්ෂක හිස් වැසුම් 01 යි |
| 52. | 47787 | නිල්පාට හෝස් බට රෝල් 01 යි |
| 53. | 26176 | සුදුපාට මැටි පිහන් 03 යි,<br>අඩු කෝප්ප 03 යි<br>වීදුරු අඩු කෝප්ප 02 යි |
| 54. | (විවිධ) | විවිධ නඩු අංකවලට අදාළ හිස් බූලි තොගයක් |
| 55. | එම | විවිධ නඩු අංකවලට අදාළ බැරල් තොගයක් |
| 56. | එම | විවිධ නඩු අංකවලට අදාළ උදළු තොගයක් |
| 57. | එම | විවිධ නඩු අංකවලට අදාළ සවල් තොගයක් |
| 58. | එම | විවිධ නඩු අංකවලට අදාලව මැණික් ගැරුම් වට්ටි |
| 59. | එම | විවිධ නඩු අංකවලට අදාළ වීදුරු තොගයක් |
| 60. | එම | විවිධ නඩු අංකවලට අදාළ හිස් බෝතල් තොගයක් |
| 61. | අංක රහිත | දිරාපත් වී ඇති ලෑලි කැබලි තොගයක් |
| 62. | 73525 | ගෑස් සිලින්ඩර් 01 ක් සහ එහි ලිප් 01 යි. |

06–478

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමේ නිවේදනය

කුරුළුකන්ද, ඉමදූව පාර, අහංගම යන ලිපිනයේ පදිංචි කාලාඑවලින් බ්‍රවුන් වන මම මෙසේ ප්‍රකාශ කරන වග නම්,

ඉහත මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් ජී. එස්. ජේ. විදානපතිරණ මහතා විසින් ලියාසහතික කරන ලද අංක 3450 හා 2006.12.05 දිනැති ඇටර්නි බලපත්‍රය මත ගාල්ල දිසානායක මාවත, ආනත්තගොඩ පදිංචි රොෂාන් පණ්ඩුකාභය සූරියආරච්චි (ජාතික හැඳුනුම්පත් අංක 690841029 හිමි) නමැති අයට පවරා තිබූ ඇටර්නි බලය අද පටන් 2007.05.23 දින අවලංගු කර ශුන්‍ය හා බලරහිත කරමි.

තවද, මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බව මෙයින් නිවේදනය කරමි.

කලාඑවලින් බ්‍රවුන්

06 –375

## සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ මහජන නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 (2) වගන්තිය අනුව 2007 මැයි 9 වන දින සිට ක්‍රියාත්මක වේ.

**සමාගමේ පැරණි නාමය**
කොමර්ෂල් ෆන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
සමාගම් අංක N (PVS) 8612
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය
අංක 10, 5 මහල, මැජෙස්ටික් සිටි, කොළඹ 4.

**සමාගමේ නව නාමය**
සිටි ෆන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
අංක 45, බේබෘක් වීදිය,
කොළඹ 02.

2007 ජූනි මස 3 වන දින,

06 –473

### ඇටෝනි බලය අවලංගු කිරීම

අංක 22, හක්මන පාර, මාතර, පදිංචි අනුෂා ඉෂාදි දේවේන්ද්‍ර හා නාලක ඉන්ද්‍රජිත් දේවේන්ද්‍ර වන අප විසින් වර්ෂ 2006.03.11 වන දින ආර්. එල්.වී. සිල්වා නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සාක්ෂ්‍යාවත් කළ ඔප්පු අංක 4584 යටතේ අංක 22, හක්මන පාර, මාතර පදිංචි මදුරරාම, දේවේන්ද්‍රට පවරන ලද ඇටෝනි බලය 2007.06.05 දින සිට අහෝසිකර අවලංගු කර ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට සහ මහජනතාවට දැනුම් දෙමි.

මුල් ඇටෝනි බලපත්‍ර වර්ෂ 2006.03.23 වන දින ලිඛිත අධිබලයන් පිළිබඳ ලේඛණයේ 07 වන කාණ්ඩයේ 10 වන පත් තිරුවේ දිනපොත් අංක 217 යටතේ ලියාපදිංචි කර ඇත.

අනුෂා ඉෂාදී දේවේන්ද්‍ර,
නාලක ඉන්ද්‍රජිත් දේවේන්ද්‍ර.

2007 ජූනි මස 05 වැනි දින,

06-412

### දැන්වීමයි

දන්කොටුවේ පදිංචි, ශ්‍රී රාම වෛද්‍යසේඛර මුදියන්සේලාගේ ගාමිණී කරුණාරත්න රණවන වන මම, මෙදින සිට මාසයක කාලයක් ඉකුත්වූ පසු නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉල්ලීමක් කරන බවට නොතාරිස් ආඥා පනතේ ආ-2 වගන්තිය යටතේ සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

එස්. ආර්. ඩබ්ලිව්. එම්. ජී. කේ. රණවන.

2007 මැයි මස 24 වැනි දින,
බාලිකා විදුහල පිටුපස,
දන්කොටුව

06-434

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ජාතික ඉතිරි කිරීමේ බැංකුව

සංශෝධිත පරිදි වූ 1990 අංක 04 දරන බැංකුව මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ විකිණීම

ජාතික ඉතිරි කිරීමේ බැංකුව සතු අගනා දේපලක් වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමා තුළ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, කහතුඩුව ගමේ පිහිටි හීටවලදෙනිය *හෙවත්* ඔබාදා දෙනිය නමැති ඉඩමෙන් මැන සාදන ලද අංක 1163 හා 1997.03.26 දින දරන පිඹුරේ පෙන්නුම් කරන ඇති ලොට් අංක 34 දරන බෙදා වෙන් කළ බිම් කට්ටිය ට අදාළ පර්චස් 10 ප්‍රමාණයේ වටිනා දේපල වෙන්දේසිය.

*දේපළ විස්තරය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභාවේ, වැතර උපකාර්යාල සීමා තුළ කහතුඩුව ගමේ පිහිටි හීටවලදෙනිය *හෙවත්* ඔබාදාදෙනිය නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් මැන සාදන ලද අංක 1163 හා 1997.03.26 දින දරන පිඹුරේ පෙන්නුම් කර ඇති ලොට් අංක 34 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට: ලොට් අංක ආර් (අඩි 20ක් පළල මාර්ග රක්ෂිතය) ද, නැගෙනහිරට: ලොට් අංක 33 ද, දකුණට: ලොට් අංක 32 හා ආර් 10 (කණුව) ද, බටහිරට: ලොට් අංක 35 ද, මායිම් ඇතුළත පිහිටි පර්. 10 (අක්. 0 රූ. 0 පර්. 10) විශාලත්වය ඇති බිම් කට්ටිය ද, ගොඩනැගිලි, ගස්, වගාවන් සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කිරියාලයේ (දැන් හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය) පිටු අංක 253/ 276 යටතේ ලියාපදිංචි වී ඇත.

යථෝක්ත අංක1163 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක ආර් 3 සහ ආර් 5 මාර්ග රක්ෂිත මත ගමන් කිරීමේ අයිතිය ද සහිතව.

මෙම දේපල ජාතික ඉතිරි කිරීමේ බැංකුවට උකස් තබා ඇත්තේ ජයතිලකවත්ත, මූණගම, හොරණ පදිංචි ජේ. ආර්. කේ. නාවින්න මහතාය.

*දේපළට ළඟාවීම.–* කොළඹ හොරණ පාර දිගේ කිලෝ මීටර් 25 ක් හා කහතුඩුව හන්දිය දෙසට මීටර් 250ක් පමණ ගොස්, "ඉන්දු ලංකා වානේ කම්මල" ළඟින් වමට හැරී හෝමාගම දෙසට කිලෝ මීටර් 1 1/2ක් පමණ ගොස් "සදාතැන්න" නාම පුවරුව ළඟින් වමට හැරී ගම් සභා පාර දිගේ මීටර් 40ක් පමණ ගිය තැන පිහිටි "සංවර්ධන සැලැස්ම" ළඟින් දකුණට හැරී අඩි 20 ක් පළල මාර්ග රක්ෂිතය දිගේ මීටර් 125ක් පමණ ගොස් අවසානයේ වමට හැරී මීටර් 10 ක් පමණ ඉදිරියට ගිය තැන වම් පසින් දේපල පිහිටා ඇත.

මෙම දේපළ අප විසින් 2007 ජූලි මස 11 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේදී, ඊට අයත් සියලු දේ සමග ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය නිම වූ වහාම පහත සඳහන් මුදල් ප්‍රමාණයන් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් 25%ක්,
2. ගැණුම් මිළෙන් 1%ක් ප්‍රාදේශීය සභා අයබදු ලෙස ගෙවිය යුතුය.
3. ගැණුම් මිළෙන් 2 1/2% (සියයට දෙකහමාරක්)වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය.
4. සම්පූර්ණ ප්‍රචාරක ගාස්තු වියදම රු. 90,697,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500ක්,
6. වෙන්දේසිය සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 3,000 ක් ගෙවිය යුතුය.

7. විකුණුම් කොන්දේසි ගාස්තු රු. 750 ක් ගෙවිය යුතුය.

ගැණුම් මිළෙන් ඉතිරි වූ 75% ක මුදල, වෙන්දේසි දින සිට දින 30 ක් තුළ බැංකුව වෙත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා සහකාර සාමාන්‍යාධිකාරී (ණය) නිවාස ණය අංශය, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011-2576132.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ බැංකු සඳහා පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2224371
081-2227593
ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : samera@diamond.lanka.net

*අගනුවර කාර්යාලය* :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 94 (0) 112585408, 2502680
ෆැක්ස් අංකය : 94 (0) 112588176.
ඊමේල් : samera@srilanka.net

06-371

---

## කඳුරට සංවර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානියා ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, දියත්ලක කෝරළයේ, උඩහේවාහැට කොට්ටල පිහිටි හඟුරන්කෙත වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එච්. කේ. සී. ජයලත් මහතා විසින් 1998.08.13 - 1998.08.31 වැනි දින මැන සාදන ලද අංක 150 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 49 දරන රූඩ් එකයි පර්චස් පහළොවයි දශම තුනක් (අක්. 0 රූ. 01 පර්. 15.35) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේත් වේ. බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක මහතා විසින් 1998.08.18 වැනි දින මැන සාදන ලද අංක 7682 ඒ පිඹුරේ ප්‍රකාර කැබලි අංක 01 දරන රූඩ් එකයි, පර්චස් පහළොවයි දශම තුනයි පහක් (අක්. 0 රූ. 1 පර්. 15.35) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි දේත් කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අප වෙත පවරා ඇති බලය මත 2007 ජූලි මස 09 වැනි දින සඳුදා දින පෙ. ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම ඉඩම කඳුරට සංවර්ධන බැංකුවට උකස් කර ඇත්තේ එස්. පී. ආනන්ද ෆොන්සේකා සහ ඒ. ඩී. මාසකෝරාල යන අය විසින් ය.

වැඩි විස්තර සඳහා 2006.04.25 වැනි දින දිනමිණ, තිනකරන් සහ ඩේලිනිව්ස් පුවත් පත් වලත්, 2006.02.10 වැනි දින *රජයේ ගැසට් පත්‍රයත්* බලන්න.

*ගෙවීම් පිළිවෙළ.*– ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ මුදලින් පහත ගෙවීම් කළ යුතුය.

1. විකුණුම් මිලෙන් 25%ක්,
2. ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු විකුණුම් මිලෙන් 1%ක්,
3. වෙන්දේසිකරුගේ ගාස්තුව විකුණුම් මිලෙන් 2.5%ක්
4. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වේනොත් එම මුදල,
5. ලිපිකාර හා සෝෂක ගාස්තු රු. 500,
6. නොතාරිස් ගාස්තු රු. 3,000.

ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත කඳුරට සංවර්ධන බැංකුවේ ප්‍රධාන කාර්යාලයට ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂාවට හා වැඩි විස්තර සඳහා මහනුවර, කටුගස්තොට පාරේ, අංක 130 හි පිහිටි කඳුරට සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලය විමසන්න.

දුරකථන අංක : 081-2214122 ෆැක්ස් : 081-2214123.

ෂොක්මන් සහ සමරවික්‍රම,
9001 2000 සහතිකය ලත් ශ්‍රී ලංකාවේ
පිළිගත් පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපල ඒජන්තවරු

| *ප්‍රධාන කාර්යාලය* : | *නාගරික කාර්යාලය හා වෙන්දේසි ශාලාව:* |
|---|---|
| අංක 24, ටොරින්ටන් පාර | අංක 290, හැව්ලොක් පාර, |
| මහනුවර. | කොළඹ 05. |
| දුරකථන අංක: 081-2227593 | දුරකථන අංක:011-2585408, 2502680 |
| ෆැක්ස් අංක :081-2224371 | ෆැක්ස් : 011-2588176 |
| ඊමේල් : schokmankand@sltnet.lk | ඊමේල් : schokman@samera 1892.com |

06-466

---

## ජාතික ඉතිරි කිරීමේ බැංකුව

### සංශෝධිත පරිදි වූ 1990 අංක 04 දරණ බැංකුව මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 13 වන වගන්තිය යටතේ විකිණීම

### ජාතික ඉතිරි කිරීමේ බැංකුව සතු අගනා දේපලක් වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමා තුල, මාදුළුවාව ගමේ පිහිටි නිල්වන්ගල වත්ත නමැති ඉඩමෙන් මැන සාදන ලද අංක 2169 හා 1998.10.14 දින දරන පිඹුරේ පෙන්නුම් කර ඇති ලොට් අංක 09 දරන බෙදා වෙන් කළ බිම් කට්ටියට අදාල පර්චස් 10 ප්‍රමාණයේ වටිනා දේපල වෙන්දේසිය.

*දේපල විස්තරය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමා තුළ, මාදුළුවාවේ පිහිටි නිල්වන්ගල වත්ත

නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් මැන සාදන ලද අංක 2169 හා 1998.10.14 දින දරන පිඹුරේ පෙන්නුම් කර ඇති ලොට් අංක 9 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් අංක 10 ද, නැගෙනහිරට: ලොට් අංක 17 ද, දකුණට: ලොට් අංක 8 ද, බටහිරට: ඩී. යූ. ජයසූරියට අයත් දේපළද, යන මායිම් ඇතුලත පිහිටි පර්. 10 (0 අක්. 0 රූඩ්. 10 පර්.) විශාලත්වය ඇති බිම් කට්ටිය සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිටු අංක එන් 215/190 යටතේ ලියාපදිංචි වී ඇත.

අංක 2169 දරන මිනින්දෝරු සැලැස්මේ දැක්වෙන ලොට් අංක 17 (අඩි 20 මාර්ග රක්ෂිතය) සහ වෙනත් සියලුම මාර්ග රක්ෂිතයන් හා යට කී අංක 2169 දරන සැලැස්ම ලොට් අංක 60 දරන බිම් කට්ටිය (සුබසාධන කටයුතු සඳහා වෙන් කළ රක්ෂිතය) මත ගමන් කිරීමේ අයිතිය හා වෙනත් අයිතීන්ද සහිතව.

මෙම දේපල ජාතික ඉතිරි කිරීමේ බැංකුවට උකස් තබා ඇත්තේ අංක 118, සීකෝ ගාඩින්ස්, ගැඩබුවාන, පිළියන්දල පදිංචි එම්. ආර්. කමිල් මහතා ය.

*දේපලට ළඟාවීම*:- හෝමගම සිට හයිලෙවල් පාර දිගේ අවිස්සාවේල්ල දෙසට කිලෝ මීටර් 03 ක් පමණ ගිය තැන ගොඩගම හන්දියෙන් දකුණට හැරී පාදුක්ක පාරට එළැඹ කිලෝ මීටර් 03 ක් පමණ ගිය තැන වටරැක දුම්රිය පළ හන්දිය හමුවනු ඇත. එතැනින් දකුණට ඇති හොරගල පාර දිගේ කිලෝ මීටර් 2 . 5 ක් පමණ ගොස් මාදුළුවාව හන්දියට පිවිස දකුණට ඇති ගල්වල පාරට හැරී තවත් මීටර් 250 ක් ඉදිරියට යන්න. අවසානයේ දකුණට ඇති සාමාන්‍ය බොරළු පාර දිගේ මීටර් 200 ක් ගිය තැන පාරේ දකුණු පැත්තට වන්නට දේපල පිහිටා ඇත.

මෙම දේපල අප විසින් 2007 ජුලි මස 18 වෙනි දින පෙ. ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ දී, ඊට අයත් සියලු දේ සමග ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*:- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය නිමවූ වහාම පහත සඳහන් මුදල් ප්‍රමාණයන් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25% ක්,
2. ගැණුම් මිලෙන් 1% ක් ප්‍රාදේශීය සභා අයබදු ලෙස ගෙවිය යුතු ය,
3. ගැණුම් මිලෙන් 2 1/2% ක් (සියයට දෙකහමාරක ප්‍රතිශතය) ක්, වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතු ය,
4. සම්පූර්ණ ප්‍රචාරක ගාස්තු වියදම රු. 88,011,
5. ලිපිකරුගේ හා සෝෂකයේ ගාස්තුව රු. 500 ක්
6. වෙන්දේසිය සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 3,000 ක් ගෙවිය යුතු ය.
7. විකුණුම් කොන්දේසි ගාස්තු රු. 750 ගෙවිය යුතු ය.

ගැණුම් මිලෙන් ඉතිරි වූ 75% ක මුදල, වෙන්දේසි දින සිට දින 30 ක් තුළ බැංකුව වෙත ගෙවිය යුතු ය.

වැඩිදුර විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා සහකාර සාමාන්‍යාධිකාරී (ණය), නිවාස ණය අංශය, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර කොළඹ 03.

දුරකථන අංක : 011 - 2576132

ශොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ බැංකු සඳහා පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර
දුරකථන අංක : 081-2224371, 081-2227593
ෆැක්ස් අංක :081 - 2224371
ඊමේල් : samera@diamond.lanka.net

*අගනුවර කාර්යාලය* :
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05
දුරකථන අංක : 94(0)-112585408, 2502680
ෆැක්ස් අංක : 94(0) 11 2588176
ඊමේල් : samera@srilanka.net

06-372

---

**ඩීඑෆ්සීසී බැංකුව**

(පෙර ලංකා සංවර්ධන මුදල් සංස්ථාව)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ වෙන්දේසි කිරීම

**අගනා දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

*අංක 2291 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, කොටපොල පිහිටි පහලවත්ත *නොහොත්* වලව්වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එන්. පී. කුඩාහෙට්ටි මහතා විසින් මැන සාදන ලදුව, මාතර දිසා අධිකරණයේ අංක පී 1290 දරන නඩුවට ගොනුකර තිබෙන අංක 1018 හා 1958.08.29 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ බිම් කට්ටිය ලොට් 01 ප්‍රමාණය අ. 0 රූ. 01 පර්. 3.66 (රූඩ් එකයි, පර්චස් තුනයි දශම හයයි හය) (එහි තුළ ඇති ගොඩනැගිලි. වැව්, සහ වෙනත් දේ සමග වේ.)

*අංක 2292 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කරන ලද චන්කම් විස්තරය*

කුරේ ලකුණ දරන සුපර් කලර් සෙපරේටරය
ප්ලුරොසන්ට් ටයිප්, කුරේ 80 ඩීකේ මොඩල්
(කැපැසිටි 160-300 කි. ග්‍රෑ./පැයට සහ 2 ස්ටේජ්)
කන්සිස්ටිං ඔෆ් ඉලෙක්ට්‍රොනික් සෙන්සර් ඇන්ඩ් ඇසෙම්බ්ලි විත් වේරියබල් ස්පීඩ්, බකට් කන්වේයර් (ස්ටීල්) ඇන්ඩ් ස්කෲ කන්වේයර්

කම්ප්ලීට් විත් එයාර් කම්ප්‍රෙසර්
පවර් සෝස් 440 වී 50 එච් ඉසෙඩ්, 3 ජේස්

කොස්මෝදර ටී ෆැක්ටර් යන නාම විලාශයෙන් සහ අභිධානයෙන් තනි අයිති ව්‍යාපාරයක් පවත්වාගෙන යන කොටපොල අමරදාස ලියනගේ යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලද දේපල ඩීඑෆ්සීසී බැංකුව මගින් මා වෙත පවරන ලද බලතල අනුව වර්ෂ 2007 ක් වූ ජූලි මස 16 වැනි දින ප. ව. 3.30 ට ආරම්භකර එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සහා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තු රු. 2,000,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
6. සියළුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බද්ධ, තීරු බද්ද හෝ වෙනත් බදු ගෙවීම් නිකුත් කළ දින සිට දින 30ක් ඇතුලත දී ගෙවිය යුතුය.

වැඩි විස්තර සඳහා ඩීඑෆ්සීසී බැංකුවේ නීති නිලධාරී අමතන්න.

දුරකථන අංක : 011-2440366.

ගාමිණී බී. එස්. දියාව,
වෙන්දේසිකරු, තක්සේරුකරු සහ බ්‍රෝකර්වරු.

අංක 247, ප්‍රීතිපුර පාර,
පල්ලිය වත්ත,
හැඳල,
වත්තල.
දුරකථන අංක : 2949010, 0777-281723

06-467/2

---

## ඩීඑෆ්සීසී බැංකුව
(පෙර ලංකා සංවර්ධන මුදල් සංස්ථාව)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ වෙන්දේසි කිරීම

#### අගනා දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, පැද්දපිටියේ පිහිටි ටී. පී. අංක 246367 දරන කොටවලගොඩහේන, ටී. පී. අංක 829940 දරන කරාවේගොඩ සහ ටී. පී. අංක 304924 සහ 285939 දරන කොටවලගොඩ සහ ඊරියන්කැලේගොඩ නැමති එකට යාවූ ඉඩම්වලින් සංයුක්ත වන කොටවලගොඩවත්ත නැමැති ඉඩමේ ලොට් අංක 6 දරන කට්ටියෙන් බලයලත් මිනින්දෝරු එම්. ජේ. එස්. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 3347 හා 1990.12.25 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ප්‍රමාණය අ. 0 රූ. 01. පර්. 0 (රූඩ් එකයි), (එහි තුළ ඇති ගොඩනැගිලි වැව්ලි සහ වෙනත් දේ සමග වේ.)

2. 1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, පැද්දපිටියේ පිහිටි ටී. පී. අංක 246367 දරන කොටවලගොඩහේන, ටී. පී. අංක 829940 දරන කරාවේගොඩ සහ ටී. පී. අංක 304924 සහ 285939 දරන කොටවලගොඩ සහ ඊරියන්කැලේගොඩ නමැති එකට යාවූ ඉඩම්වලින් සංයුක්ත වන කොටවලගොඩවත්ත නැමැති ඉඩමේ ලොට් අංක 6 දරන කට්ටියෙන් එකී අංක 3347 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 ප්‍රමාණය අ. 0 රූ. 01 පර්. 0 (රූඩ් එකයි) (එහි තුළ ඇති ගොඩනැගිලි, වැව්ලි සහ වෙනත් දේ සමග වේ.)

| *උපකරණ* | *ප්‍රමාණය* |
|---|---|
| ඉන්දියාවේ සාදන ලද අ. බ. 30 මෝටර් | 01 |
| ඉන්දියාවේ සාදන ලද අ. බ. 15 මෝටර් | 01 |
| ඉන්දියාවේ සාදන ලද අ. බ. 05 මෝටර් | 01 |
| ඉන්දියාවේ සාදන ලද අ. බ. 3.5 මෝටර් | 01 |
| ජර්මනියේ සාදන ලද අඩි 5 බෙන්ච් සෝ | 01 |
| ජර්මනියේ සාදන ලද අඩි 2.5 බෙන්ච් සෝ | 01 |
| බෙන්ච් | 05 |
| සීලිං සෝ මැෂින් | 01 |

"අචින්ත යාන්ත්‍රික වඩු කර්මාන්තය" *නොහොත්* අචින්ත යාන්ත්‍රික වඩු කාර්මිකයෝ යන නාම විලාශයෙන් සහ අභිධානයෙන් තනි අයිති ව්‍යාපාරයක් පවත්වාගෙන යන උපුල් අබේවික්‍රම දිසානායක විසින් 1993.12.01 දින අංක 2294, 1997.01.22 දින අංක 2846 සහ 1999.04.28 දින 3324 දරන උකස් බැඳුම්කරය මත ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලද දේපල ඩීඑෆ්සීසී බැංකුව මගින් මා වෙත පවරන ලද බලතල අනුව වර්ෂ 2007 ක් වූ ජූලි මස 16 වැනි දින පෙ. ව. 11.30 ට ආරම්භකර එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සහා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තු රු. 2,000,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
6. සියළුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බද්ධ තීරු, බද්ද හෝ වෙනත් බදු ගෙවීම් නිකුත් කළ දින සිට දින 30ක් ඇතුලත දී ගෙවිය යුතුය.

වැඩි විස්තර සඳහා ඩීඑෆ්සීසී බැංකුවේ නීති නිලධාරී අමතන්න.

දුරකථන අංක : 011-2440366.

ගාමිණී බී. එස්. දියාව,
වෙන්දේසිකරු තක්සේරුකරු සහ බ්‍රෝකර්වරු.

අංක 247, ප්‍රීතිපුර පාර,
පල්ලිය වත්ත,
හැඳල,
වත්තල.
දුරකථන අංක: 2949010, 0777-281723

06-467/1

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

### හොරණ කහටපිටියෙන් අ. 01, රූ. 01 ක් විශාල අගනා ඉඩමක්

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, කුඹුකේ පත්තුවේ, කහටපිටියේ පිහිටි, "හැඳිවිලාදෙණිය" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එන්. ද එස්. වීරක්කොඩි විසින් 1992 අප්‍රේල් මස 04 වැනි දින සාදන ලද අංක 3027 දරන පිඹුර ප්‍රකාර නැගෙනහිරට: ජේ. දොන් අන්දිරිස් සහ තවත් අය විසින් හිමිකම් පාන ලදැයි කියනු ලබන ඉඩමද, නිරිත දිගට: රජයේ ඉඩම් ද, ගිණිකොනින් පාරද, වයඹ දිගින්: හොරණ සිට පාදුක්ක දක්වා දිවෙන ප්‍රධාන පාරකින් ද, යන සතර මායිමෙන් වට වූ අක්කර එකයි රූඩ් එකක (අ. 01 රූ. 01, පර්. 0) වපසරිය ඇති පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 61/223 හි ලියාපදිංචි කර ඇත.

රුපියල් විසි ලක්ෂ තිස් දහස් එකසිය හැත්තෑ තුනයි ශත අසූහත (රු. 20,30,173.87) ක මුදලක් සහ එම මුදල මත 1995 ජනවාරි මස 13 වැනි දින වසරකට සියයට විසිපහක (25%) බැගින් පොලිය ද, නඩු ගාස්තු සහ වෙන්දේසිකරුගේ ගාස්තු ද අයකර ගැනීම සඳහා හොරණ, කහටපිටියේ පදිංචි කුකුළගේ ජනක පුෂ්පකුමාර යන අයට විරුද්ධව කොළඹ 03 ශාන්ත මයිකල් පාරේ, අංක 26 දරන ස්ථානයේ පිහිටා ඇති මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් යන ආයතනය විසින් පවරා ඇති කොළඹ දිසා අධිකරණයේ නඩු අංක 16670/ එම් බී දරන නඩුවෙන් මා වෙත පවරන ලද කොමිසම් මත ඉහත සඳහන් දේපළ වර්ෂ 2007 ක් වූ ජූලි මස 20 වැනි දින පෙරවරු 11.00 අදාල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය. (1) ගැණුම් මිලෙන් 25%ක් ද, (2) පලාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) වෙන්දේසි සඳහා දරන්නට වූ වියදම් ද, (5) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ ගාස්තු වශයෙන් රු. 2,000 (6) ලිපිකරු හා ගෝෂක ගාස්තු වශයෙන් රු. 1,000ක මුදලක් ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ අංක 16670/එම් බී දරන මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩි විස්තර සහ අදාල ලියවිලි පරික්ෂා කිරීම සඳහා කොළඹ 03, ශාන්ත මයිකල් පාරේ අංක 28 දරන ස්ථානයේ පිහිටි මර්චන්ට් ගොඩනැගිල්ලේ 14 මහලේ, කළමනාකාරිණී නීති නීතිඥ මිහුරුම් ජයසිංහ මහත්මියගෙන් විමසන්න. දුරකථන අංක : 4711711 හෝ 4711781.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක: 2873656, ෆැක්ස් : 2871184 ජංගම : 0777-672082

06-468

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.